චක්‍රලේඛ 1998/02

මගේ අංකය: ඉකො/1/පුලි/147
දකුණු පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කොටුව - ගාල්ල.
1998.04.09

පියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.
(දකුණු පළාත)
ගාල්ල

**1979 අංක: 43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ බෙදාදී ඇති ඉඩම් වලට තියාදන සාදන පත්‍ර නිකුත් කිරීම .**

ඉහත සඳහන් කරුණට අදාලව කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය තුමා විසින් ඉදිරිපත් කරන ලද 1997.11.25 දිනැති කැබිනට් මණ්ඩල සන්දේශය සම්බන්ධව නීතිපතිවරයා විසින් යෝජනා කර ඇති ක්‍රියා මාර්ගයට අනුව කටයුතු කිරීමට 1997.12.10 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බව සියළු ප්‍රාදේශීය ලේකම්-වරුන් අමතන ලද ඉඩම් කොමසාරිස්ගේ අංක: 98/03 චක්‍රලේඛයෙන් දන්වා ඇත.

02 ඒ අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩමක් ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පණතේ 2 (1) වගන්තිය යටතේ රජයට පවරා ගැනීමේදී රජය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට වන්දි මුදලක් ගෙවීම අවශ්‍ය නොවේ.

03 යම් හෙයකින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් යම් ඉඩමක් පවරාගත් අවස්ථාවේ එහි මුල් අයිතිකරුට වන්දි මුදල් ගෙවා නොතිබුනි නම් පමණක් එම ඉඩම් සඳහා රජය විසින් භාණ්ඩාගාර අනුමැතිය මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත අදාල වන්දි මුදල ගෙවීමට කටයුතු කළ යුතු වේ.

04 ඉහත සඳහන් උපදෙස් පරිදි ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පණතට අයත් ඉඩම් සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමේදී පහත දක්වා ඇති ක්‍රියා මාර්ගයන් අනුගමනය කරනු ලැබේයි අපේක්ෂා කරමි.

04:01 ඉඩම් ප්‍රදාන (වි.වි) පණත යටතේ මේ දක්වා තියාදන සාදන පත්‍ර ලබාදී නැති, දිසාපති විසින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් එම පණත යටතේ ඉඩම් කච්චේරි පවත්වා, බෙදා දී ඇති ඉඩම් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය.

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ආපසු භාර දෙන ලද ඉඩම් ප්‍රදාන පණතේ 2 (1) වන වගන්තිය යටතේ රජයට පවරා නොගත් මේ දක්වා හිමිකම් සහතික ලබා දී නැති/ඇති ඉඩම් සම්බන්ධයෙන් පණතේ 2 (1) වගන්තිය යටතේ ගැසට් නිවේදන පළ කිරීමට අවශ්‍ය විස්තර මටද පිටපතක් සහිතව ඉඩම් කොමසාරිස් වෙත යැවිය යුතුය.

02 / ..